# පුංචි විතුම්

හෙෂාරා විතුම්සා

මහමායා බාලිකා විද්‍යාලය
මහනුවර

2 ශ්‍රේණිය E

# පිදුම

දෙවසරක් මුළුල්ලේ පෙළ පොතේ

අකුරු පෙළ ගලපමින් ඉතා

වෙහෙස මහන්සි වී

සිප් කිරි පෙවූ ආදරණීය

2 වසර ගුරුතුමිය වන

**ඊශ්වරී දිල්රුක්ෂි**

මහත්මියට

මේ පොත ගුරු උපහාරයක්ම

වේවා!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


පූංචි විතුමි

දවසක් පුංචි විතුමි උදේම නැගිටලා මූණ සෝදාගෙන අළුත් ඇඳුමක් ගන්න එයාගෙ රෙදි කූඩය ළඟට ගිහිං අත දානකොටම ලොකු මීයෙක් පැනලා දුවලා.....

පුංචි විතුමි බය වෙලා මහ හයියෙන් කෑ ගහලා අම්මට කතා කලා....

අම්මේ....අම්මේ.....ඉක්මනට එන්න...
අම්මා දුවගෙන ආවා....

ඇයි පුතේ...



අම්මේ....ලොකු මීයෙක් හිටියා. මේ පැත්තට පැනල දිව්වා....

අම්මා කලබල වී  සොයන්න ගත්තා..

අනේ....පුතේ නැනෙ...ඔයා බය නැතුව මේ ගවුම ඇද ගන්න....

අම්මා  මුළුතැන් ගේ  පැත්තට ගියා.

අම්මා හාල් ගන්න කබඩ් එක අරිනකොට ඒ අස්සෙ ඉදලා පැනලා දිව්වා.

ඉක්මනට තාත්තට කතා කරන්න. මෙහෙට දිව්වා..

තාත්තා ආවත් මීයා සොයාගන්න නොහැකි වුනා.

සතියක් විතර ගතවුණා.

දිනක් පාන්දර අම්මා කෑම පිසීම සඳහා අවධි වුනා...

අම්මාගේ කකුල ලගින්ම මීයා පැනලා ගියා.

අනේ මේක හරි යන්නෑ...ලොකු මීයෙක් ඉන්න වා....චුටි පුතේ පොල් කෑල්ලක් අමුණලා මී කතුර  අටවන්න....

එදා රාත්‍රියේ මී කතුර අටවලා තිබ්බා....



උදේ ම නැගිට්ට විතුම් කෑ ගහගෙන ආවා....

අම්මේ.....අම්මේ....මීයා අහුවෙලා....

අනේ....පව් අම්මෙ.....නේද?

ඔව් පුතේ....ඉක්මනට තාත්තට කතා කරන්න

අපි මීයව කැලේට ගිහිං දාමු....

අම්මෙ ඌ හොදටම බය වෙලා....මම බත් ටිකක් දෙන්න ද?

හා ....පුතේ...

තාත්තා මී කූඩුව ත්‍රීවිලරයට දා ගත්තා....මම මේ සතාව කැලේට දාලා එන්නම්.....

පුංචි විතුමිට හරිම දුකයි. විතුමිට ඇඬෙනවා....

අඬන්න එපා පුතේ....මීයන්ව අපට ගෙදර තියාගන්න බැනෙ පුතේ...කැලේ එයා සතුටින් ජීවත් වෙයි....

තාත්තා මී කූඩුව කැලේට ලගට ගෙනිහිං කිව්වා

“පුතේ ඔයාම උංව නිදහස් කරන්න” කියලා....



පුංචි චිතුමි කූඩුවෙ දොර ඇරියා විතරයි මීයා මහ වේගයෙන් දිව්වා....

පුංචි චිතුමිට වගේම හැමෝටම හරිම සතුටුයි....

‘‘උඹ සතුටින් කෑලේ ජීවත් වෙයි ‘‘අම්මා කිවුවා.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

නිමි.

978-624-208-763-4.